# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

මුදල් චක්‍රලේඛ ලිපි අංක : 07/2009

2009 සැප්තැම්බර් 22 දින.

විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන්,
ආයතනවල අධ්‍යක්ෂවරුන් සහ
මණ්ඩපවල මණ්ඩපාධිපතිවරුන් වෙත.

## 2009 වසරේ දෙසැම්බර් මාසය දක්වා වන අර්ථසාධක / විශ්‍රාම වැටුප් දායක මුදල් හා ණය වාරික ලේඛණ

අර්ථසාධක අරමුදල් වාර්ෂික ශේෂ ප්‍රකාශන පත්‍රිකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිසි වේලාවට නිකුත් කිරීම සඳහා දායක මුදල් සහ ණය වාරික ලේඛණ කලට වේලාවට ඉදිරිපත් කරන මෙන් ඔබ ආයතනයේ අදාල නිලධාරීන් හට උපදෙස් ලබාදෙන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමි. දායක මුදල් ලේඛණ සහ ණය වාරික ලේඛණ ප්‍රමාදවී ඉදිරිපත් කිරීම හේතු කොට ගෙන ආදායකයන්හට ණය ලබාදීමේදී , අර්ථසාධක අරමුදල් ආපසු ගෙවීමේදී හා විශ්‍රාමික ප්‍රතිලාභ ලබාදීමේදී අනවශ්‍ය ප්‍රමාදවීම් සිදුවිය හැකි බව සඳහන් කරනු කැමැත්තෙමි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ගය අනුගමනය කළයුතු බව මෙයින් අවධාරණය කරනු ලැබේ.

2. A. <u>2009 දායක මුදල් හා ණය වාරික ලේඛන</u>

- 2009 නොවැම්බර් මස අග දක්වා වන සියළුම අර්ථසාධක දායක මුදල් ලේඛණ , විශ්‍රාම වැටුප් දායක මුදල් ලේඛණ , ණය වාරික ලේඛණ සහ එයට අදාල පරිගණක ඩිස්කට්, <u>2009 දෙසැම්බර් මස 15 දින හෝ ඊට පූර්වයෙන් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට භාරදීමට හෝ ලැබීමට සැලැස්විය යුතුය.</u>

- 2009 දෙසැම්බර් මාසයට අදාල දායක මුදල් ලේඛණ විශ්‍රාම වැටුප් ලේඛණ, ණය වාරික ලේඛණ සහ එයට අදාල පරිගණක ඩිස්කට්, <u>2010 ජනවාරි මස 15 වන දින හෝ ඊට පූර්වයෙන් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට භාරදීමට හෝ ලැබීමට සැලැස්විය යුතුය.</u>

B. <u>2010 සඳහා අර්ථසාධක ණය හා අර්ථසාධක මුදවාහැරීම්</u>

2009 ජනවාරි මාසය සඳහා අර්ථසාධක අරමුදලින් ණය මුදල් සඳහා ඉල්ලුම්පත් , අර්ථසාධක අරමුදල් මුදවාහැරීම හා විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ඉල්ලුම්පත් , 2010 වර්ෂය තුළ එවනු ලබන ලිපි ලේඛන ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළයුත්තේ 2009 වර්ෂයේ අදාල සියළුම දායක මුදල් ලේඛන හා ණය වාරික ලේඛන ඉහත A - හි දක්වා ඇති දිනයන්ට පෙර එවීමෙන් පසුව පමණි.

C ආයතනයක් සඳහා වන 2009 දෙසැම්බර් මාසයට අදාල දායක මුදල් ණය වාරික හා විශ්‍රාම වැටුප් ලේඛන, 2010 ජනවාරි මස 15 දිනට පෙර ප්‍රතිපාදන කොමිෂන් සභාවට ලැබී නොතිබුනහොත්, එවැනි ආයතන සඳහා 2010 ජනවාරි මාසය වෙනුවෙන් අර්ථසාධක අරමුදල් ණය නිකුත් කරනු නොලැබේ.

3. 2009 වසරේ දෙසැම්බර් මාසයට අදාල දත්ත ඇතුලත් පරිගණක ඩිස්කට් සකස් කිරීමේදී මූල්‍යාධිකාරිවරුන් සහ අංශයන් අදාල ගිණුම් නිලධාරීන් විසින් පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු බව දන්වනු කැමැත්තෙමි.

A. 2009 වසරේ දෙසැම්බර් මාසයේ පරිගණක දත්ත ඩිස්කට් පිළියෙල කිරීමේදී 2009 දෙසැම්බර් මස 31 වන දින දක්වා සිදුවූ සියළුම තනතුරු නාමයන් වෙනස්වීම්, දෙපාර්තමේන්තු වෙනස්වීම්, විශේෂයෙන් සැලකිල්ලට ගතයුතුවේ. 2009 වසරේ දෙසැම්බර් මාසය සඳහා ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන පරිගණක දත්ත ඩිස්කට්වල සඳහන් ආකාරයට ඉහත සඳහන් දත්ත යාවත්කාලීන කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලය මගින් සිදු කරනු ඇත. මෙම අලුත් කිරීම වාර්ෂික පදනමක් මත සිදු කෙරෙන බැවින්, දෙපාර්තමේන්තු තනතුරු, වෙනස්වීම් ආදිය පිළිබඳව අර්ථලාභීන් විසින් වර්ෂය තුලදී කෙරෙන කිසිම පැමිණිල්ලක් ගැන සලකා බලනු නොලැබේ.

B. 2009 වසර තුළ දෙපාර්තමේන්තු සහ තනතුරු නාමයන් වෙනස්වීම මෙම වසරේ දෙසැම්බර් මසට අදාල පරිගණක දත්ත ඩිස්කට් වලට ඇතුලත් කිරීම සඳහා එම දත්තයන් නිසි පරිදි මූල්‍යාධිකාරිවරුන් වෙත දැනුම්දීම පෞද්ගලික ලිපිගොනු භාරව කටයුතු කරන නිලධාරීන්ගේ වගකීම බව සැලකිල්ලට ගතයුතු වේ.

C. ඔබගේ කාර්යාල ලිපි ලේඛනවල සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් වසර අවසානයේ නිකුත් කරනු ලබන අර්ථසාධක අරමුදල් තොරතුරු අතර, ඒ ඒ අයගේ පෞද්ගලික නම්වල කිසියම් වෙනසක් ඇත්නම්, ඒවා ඩිස්කට් මගින් නොකළ යුතුයි. එම වෙනස්කම් මුදල් චක්‍රලේඛ අංක 13/2000 හි (1) යටතේ දැක්වෙන උපදෙස් අනුව නිවැරදි කර ගැනීමට කටයුතු කළයුතුවේ.

තිස්ස හන්දගේන
ලේකම්

පිටපත්
1. සභාපති/ වි.ප්‍ර.කො.ස.
2. උප සභාපති/ වි.ප්‍ර.කො.ස.
3. ලේකම්/ වි.ප්‍ර.කො.ස.
4. මූල්‍ය පාලක / වි.ප්‍ර.කො.ස.
5. විශ්වවිද්‍යාලවල ලේඛකාධිකාරිවරුන්
6. විශ්වවිද්‍යාලවල මූල්‍යාධිකාරිවරුන්
7. ආයතන/මණ්ඩපවල ජ්‍යෙ.ස. ලේඛකාධිකාරී/ සහකාර ලේඛකාධිකාරිවරුන්
8. ආයතන / මණ්ඩපවල ජ්‍යෙ.ස. මූල්‍යාධිකාරී/සහකාර මූල්‍යාධිකාරිවරුන්
9. ප්‍රධාන අභ්‍යන්තර විගණක / වි.ප්‍ර.කො.ස.
10. ගණකාධිකාරී / වි.ප්‍ර.කො.ස.
11. නියෝජ්‍ය ගණකාධිකාරී/ වි.ප්‍ර.කො.ස.
12. විශ්වවිද්‍යාලවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්
13. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/පිරිස්
14. සහකාර ගණකාධිකාරී / විශ්‍රාම වැටුප්
15. විගණකාධිපති.